<u>නිපුණතා මට්ටම 6.2 - නියැදිකරණය සඳහා සසම්භාවී නියැදීම් ක්‍රම භාවිත කරයි.</u>

<u>සම්භාවිතා නියැදීම -</u> සම්භාවිතා නියමයන්ට අනුකූලව නියැදියක් තෝරා ගැනීම සම්භාවිතා නියැදීම ලෙස හඳුන්වයි.

- සම්භාවිතා නියැදීමේදී සන්නා සම්භාවිතාවකින් (ඥාත සම්භාවිතාවකින්) යුක්තව නියැදුම් ඒකක නියැදියට ඇතුළත් කර ගනියි.

<u>සම්භාවිතා නියැදීමේ යහපත් ලක්ෂණ</u>

1.නියැදිය බොහෝ දුරට පුද්ගලබද්ධතාවන්ගෙන් තොර වීම.
2.සංගහනයේ සෑම ඒකකයක්ම නියැදියට ඇතුළත් වීමේ නිශ්චිත සම්භාවිතාවක් තිබීම.
3.සම්භාවිතා නියැදි මගින් සංගහනයක් වඩා හොඳින් නිරූපණය වීම.
4.සංගහනය පිළිබඳ කෙරෙන අනුමිතීන් සඳහා නියැදි තේරීමට යොදා ගත හැකි නියැදීමේ ක්‍රමය වීම.
5.නියැදුම් දෝෂය ගණනය කළ හැකි වීම.

<u>සම්භාවිතා නියැදීමේ අයහපත් ලක්ෂණ</u>

1.අන්වේෂකයාට අවශ්‍ය පරිදි අධ්‍යයනයේ අරමුණට වඩාත් ගැලපෙන නියැදුම් ඒකක තෝරා ගැනීමට අවස්ථාවක් නොමැති වීම.
2.නියැදියේ තරම කුඩා වන විට නියැදිය මගින් සංගහනය නිරූපණය නොකිරීම.
3.නියැදුම් ඒකක අතර විශාල වෙනස්කම් පවතින විට මෙම ක්‍රමය සුදුසු නොවීම.

සම්භාවිතා නියැදීමේ ක්‍රම ප්‍රධාන වශයෙන් හතරකි.
1.සරල සසම්භාවී නියැදීම
2.ස්තෘත සසම්භාවී නියැදීම
3.පොකුරු නියැදීම
4.ක්‍රමවත් නියැදීම

<u>අභ්‍යාස</u>

1.ඉහත ක්‍රම හතරේ වාසි හා අවාසි 2 බැගින් ලියන්න.